# ශාසන බ්‍රහ්මචරියාව කුමකට ද
## බ්‍රහ්මචරිය සූත්‍රය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, අඞ්ගුත්තර නිකාය 2 - පිටු අංක 52 - 53)

මහණෙනි, මෙම බ්‍රහ්මචරියාව

1. ජනතාවට  නැති ගුණ පෙන්වීම පිණිස,
2. ජනතාවට චාටු බස් කීම පිණිස,
3. ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා පිණිස,
4. වාදයන්ගෙන් මිදී යාම පිණිස
5. ජනතාව මා මෙසේ හඳුනත්වා යන මේ පිණිස

වසනු නොලැබෙයි.

මහණෙනි, බඹසර වනාහි සංවරය පිණිස, ප්‍රහාණය පිණිස, නොඇලීම පිණිස, නිරෝධය පිණිස පවතියි.